# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

### වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

**වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි දෙවන වසර පරීක්ෂණය (බාහිර) - 2010**
**2011 දෙසැම්බර් /2012 ජනවාරි**

**BCOM E 2073 – සංවර්ධන ආර්ථික විද්‍යාව**


ප්‍රශ්න සංඛ්‍යාව : 06 — කාලය : පැය 03 යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

01. " සංවර්ධන ආර්ථික විද්‍යාව, ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍රයේ වඩාත් තාත්වික ශාඛාවකි." ඔබ මෙම ප්‍රකාශයට එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 20)

02. අ). රටක සංවර්ධනය මැනීමේදී ආරම්භයේ සිට නූතනය දක්වා භාවිතා කළ සම්මත දර්ශක මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ). වර්තමානයේදී ප්‍රායෝගිකව වඩාත් උචිත වන්නේ මින් කුමන දර්ශකයදැයි හේතු සහිතව විස්තර කරන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

03. සංවර්ධනය වෙමින් පවතින රටවලට පොදු ලක්ෂණ සවිස්තරාත්මකව පැහැදිලි කරන්න.

(ලකුණු 20)

04. ශ්‍රී ලංකාවේ කුඩා සහ මධ්‍යම පරිමාණ කර්මාන්ත දියුණු කිරීම සඳහා 2012 අයවැයෙන් යෝජනා වී ඇති උපාය මාර්ග කවරේදැයි සවිස්තරාත්මකව පැහැදිලි කරන්න.

(ලකුණු 20)

05. " රටක යටිතල පහසුකම් වර්ධනය සංවර්ධනයේ පූර්ව අවශ්‍යතා බිහිවන අවස්ථාවකි. " මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය වර්තමානයේ ගෙන ඇති පියවරයන් පැහැදිලි කර එහි ආර්ථික ප්‍රතිවිපාක විස්තර කරන්න.

(ලකුණු 20)

06. පහත දෑ විස්තර කරන්න.

අ). ගෝලීයකරණය හා ශ්‍රී ලංකාවේ අපනයන වෙළඳපොල

ආ). ආර්ථික සංවර්ධනයෙහිලා කෘෂි අංශයේ කාර්යභාරය.

(ලකුණු 20)